# භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුව
# திறைசேரி செயற்பாடுகள் திணைக்களம்
# Department of Treasury Operations

තැ.පෙ.1559, මහා භාණ්ඩාගාරය, මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය, කොළඹ 01, ශ්‍රී ලංකාව
த.பெ.1559, பொது திறைசேரி, நிதி, திட்டமிடல் மற்றும் பொருளாதார அபிவிருத்தி அமைச்சு , கொழும்பு 01 ,இலங்கை
P.O.Box: 1559, General Treasury, Ministry of Finance, Planning and Economic Development, Colombo 01, Sri Lanka

| | | | | | |
|---|---|---|---|---|---|
| කාර්යාලය<br>அலுவலகம்<br>Office | +94 11 2484600<br>+94 11 2484700 | ෆැක්ස්<br>பெக்ஸ்<br>Fax | +94 11 2484970<br>+94 11 2320042 | වෙබ් අඩවිය<br>இணையதளம்<br>Website | www.treasury.gov.lk |


| | | | | | |
|---|---|---|---|---|---|
| මගේ අංකය<br>எனது இல<br>My No. | TO/REV/01/03/01 | ඔබේ අංකය<br>உமது இல<br>Your | | දිනය<br>திகதி<br>Date | 25.05.2026 |

සියළුම අමාත්‍යාංශ ලේකම්වරුන්
දෙපාර්තමේන්තු ප්‍රධානීන්
දිස්ත්‍රික් ලේකම්වරුන් වෙත

**2026.06.30 දිනට හිඟ ආදායම් වාර්තා ඉදිරිපත් කිරීම**

2020.08.28 දිනැති රාජ්‍ය මුදල් චක්‍රලේඛ අංක 01/2020 හා සබැඳිව මෙම දෙපාර්තමේන්තුව විසින් 2020.10.14 දින නිකුත් කරන ලද මාර්ගෝපදේශ අංක 03 හි සඳහන් උපදෙස් කෙරෙහි අවධානය යොමු කෙරේ.

02. ආදායම් පිළිබඳ ගණන්දීමේ නිලධාරීන් විසින් මු.රෙ.128(2)(ඇ) විධිවිධාන ප්‍රකාරව තම වගකීම යටතේ පවතින ආදායම් සංකේතාංකවලට අදාලව අර්ධ වාර්ෂිකව හිඟ ආදායම් පිළිබඳ වාර්තා විගණකාධිපති වෙත ඉදිරිපත් කළයුතුව ඇත. භාණ්ඩාගාර මෙහෙයුම් අධ්‍යක්ෂ ජනරාල් ගණන් දීමේ නිලධාරියා ලෙස කටයුතු කරනු ලබන පහත සඳහන් ආදායම් සංකේතාංක යටතේ එකතු කරන ආදායම් පිළිබඳව අදාල ප්‍රධාන ගණන්දීමේ නිලධාරීන් /ගණන්දීමේ නිලධාරීන් විසින් අර්ධ වාර්ෂිකව ඉදිරිපත් කරනු ලබන තොරතුරු ඒකාබද්ධ කිරීමෙන් හිඟ ආදායම් වාර්තා සකස් කර විගණකාධිපති වෙත ඉදිරිපත් කරනු ලැබේ.

| ආදායම් සංකේතාංකය | විස්තරය |
|---|---|
| 20.02.01.99 | රජයේ වත්කම්වලින් ලැබෙන ආදායම - අනෙකුත් කුලී |
| 20.02.02.99 | පොළිය - අනෙකුත් |
| 20.03.01.00 | විකුණුම් හා ගාස්තු - දෙපාර්තමේන්තුමය විකිණීම් |
| 20.03.02.99 | විකුණුම් හා ගාස්තු - පරිපාලනාත්මක ගාස්තු හා ගෙවීම් - විවිධ |
| 20.03.03.02 | විකුණුම් හා ගාස්තු - දඩ මුදල් හා රාජසන්තක කිරීම්- අනෙකුත් |
| 20.03.99.00 | විකුණුම් හා ගාස්තු - අනිකුත් ලැබීම් |
| 20.05.99.00 | වර්තන පැවරීම - ජාතික ලොතරැයි මණ්ඩලය හා අනෙකුත් පැවරුම |

03. එබැවින් ඉහත දැක්වෙන එක් එක් ආදායම් සංකේතාංක යටතේ නියමිත නීති සහ රෙගුලාසි ප්‍රකාරව නඩත්තු කරන ලද හිඟ ආදායම් සම්බන්ධව ගිණුම් වාර්තා පොත් යනාදිය නිසි පරිදි සංසන්දනය කර රාජ්‍ය මුදල් චක්‍රලේඛ අංක 01/2020 ට අදාලව මෙම දෙපාර්තමේන්තුව විසින් නිකුත් කරන ලද මාර්ගෝපදේශ අංක 03 හි සඳහන් උපදෙස් අනුගමනය කර අමුණා ඇති **TOD/REV/01(i)** ආකෘති පත්‍රය අනුව 2026.06.30 දිනට සකස්කරන ලද හිඟ ආදායම් වාර්තා **2026.07.17** දිනට පෙර revenue@tod.treasury.gov.lk යන විද්‍යුත් ලිපිනය වෙත ඉදිරිපත් කිරීමට කටයුතු කරන මෙන් කාරුණිකව ඉල්ලා සිටිමි. අදාල දිනට හිඟ ආදායම් කිසිවක් නොමැති නම් ඒ බව සඳහන් කරමින් හිස් වාර්තාවක් ඉදිරිපත් කළ යුතු වේ.

04. තවද එක් එක් වර්ෂයට අදාල හිඟ ආදායමට අනුරූපිව 2026 වර්ෂය තුලදී අයකරන ලද මුදල් පිළිබඳ විස්තර ද එම කාලපරිච්ඡේදය තුළදී මු.රෙ.113 පරිදි භාණ්ඩාගාරයෙන් ලද අනුමැතිය ප්‍රකාරව අත්හරින ලද එක් එක් ආදායම් වේ නම් ඒ පිළිබඳ විස්තරද අමුණා ඇති **TOD/REV/02(i)** ආකෘති පත්‍රයේ සඳහන් කර ඉදිරිපත් කළ යුතුවේ.

05. එමෙන්ම රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්ති චක්‍රලේඛ අංක 01/2015(V) ප්‍රකාරව ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ විස්තරාත්මක වාර්තා සහ පොත්පත් ඔබ විසින් නිසි පරිදි පවත්වා ගත යුතු බව වැඩිදුරටත් දන්වා සිටිමි.

**ජේ.එම්.එස්.මල්කාන්ති**
අධ්‍යක්ෂ ජනරාල්
භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුව

පිටපත - විගණකාධිපති, ජාතික විගණන කාර්යාලය - කරු.දැ.ගැ.ස.

ආකෘති පත්‍ර අංක - TOD/REV/01 (i)

## 2026.06.30 දිනට හිඟ ආදායම් පිළිබඳ වාර්තාව

I. අමාත්‍යාංශය / දෙපාර්තමේන්තුව / දිස්ත්‍රික් ලේකම් කාර්යාලය ..........................................................................

II. ආදායම් විස්තරය - ..........................................................................

III. ආදායම් සංකේතාංකය - ..........................................................................

| විස්තරය | හිඟ ආදායම් | | | | | හිඟ සඳහා හේතු | හිඟ අයකර ගැනීම සඳහා ගනු ලැබූ ක්‍රියාමාර්ග | හිඟ අයකර ගැනීමට ඇති හැකියාව පිළිබඳ සහතිකය |
|---|---|---|---|---|---|---|---|---|
| | 2023.12.31 දින දක්වා සමුච්චිත හිඟ මුදල රු. | 2024 වසරට අදාල හිඟ මුදල රු. | 2025 වසරට අදාල හිඟ මුදල රු. | 2026.06.30 දක්වා අදාල හිඟ මුදල රු. | 2026.06.30 දක්වා මුළු හිඟ මුදල (2 +3 + 4 +5) රු. | * | * | * |
| (1) | (2) | (3) | (4) | (5) | (6) | (7) | (8) | (9) |
| | | | | | | | | |
| | | | | | | | | |
| | | | | | | | | |
| | | | | | | | | |
| | | | | | | | | |

2025.12.31 දිනට ඉදිරිපත් කල හිඟ ආදායම් වාර්තාව මගින් ඉහත වගුවේ තීරු අංක 2 සිට 4 දක්වා වාර්තා කරන ලද එක් එක් හිඟ මුදල් වලින් 2026 වර්ෂය තුල ලද අයවීම් / අත්හැර දැමීම් ඇතොත් ඒවා අඩු කල පසු ලැබෙන මුදලට මෙම තීරු යටතේ වන එකතුන් සමාන විය යුතුවේ. එසේ නැතහොත් අදාල වෙනස්කම් සඳහා විස්තරාත්මක හේතු ඇමුණුම් ලෙස ඉදිරිපත් කළ යුතුය.

* 7 , 8 සහ 9 තීරු සඳහා වලංගු හේතූන් අනිවාර්යයෙන්ම සඳහන් කල යුතුය.

**සකස් කලේ :** ..........................................................

**පරීක්ෂා කලේ:** ..........................................................................

**ප්‍ර.මු.නි./අධ්‍යක්ෂ (මුදල්)/ප්‍ර.ගණකාධිකාරී/ගණකාධිකාරී**

**ඉහත සඳහන් තොරතුරු නිවැරදි බවට සහතික කරමි**

..........................................................................

**ලේකම් / දෙපාර්තමේන්තු ප්‍රධානියා / දිස්ත්‍රික් ලේකම්**

**(නිල මුද්‍රාව)**

**දිනය:................................**

ආකෘති පත්‍ර අංක - TOD/REV/02(i)

## 2026.06.30 දිනට හිඟ ආදායම් එකතු කිරීම් පිළිබඳ සහ අනුමත ආදායම් අතහැරීම් පිළිබඳ ප්‍රකාශය

අමාත්‍යාංශය / දෙපාර්තමේන්තුව / දිස්ත්‍රික් ලේකම් කාර්යාලය :

ආදායම් සංකේතාංකය :

| විස්තරය | 2026 වර්ෂය තුල හිඟ ආදායම් එකතු කිරීම | | | | * 2026 වර්ෂය තුල හිඟ ආදායම් අත්හැර දැමීම | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | 2023.12.31 දින දක්වා හිඟ මුදලට අනුරූපීව එකතු කිරීම් | 2024 වසරට අදාල හිඟ මුදලට අනුරූපීව එකතු කිරීම් | 2025 වසරට අදාල හිඟ මුදලට අනුරූපීව එකතු කිරීම් | හිඟ මුදලට අදාලව මුළු එකතු කිරීම් (2+3+4) | 2023.12.31 දක්වා කාලයට අදාල හිඟ මුදලට අනුරූපීව අත්හැර දැමීම් | 2023.12.31 දක්වා කාලයට මු.රෙ. 113 ප්‍රකාරව අත්හැර දැමීම් සඳහා බලය දුන් භාණ්ඩාගාර ලිපි යොමුව සහ දිනය | 2024 වසරට අදාලව වසරට අදාල හිඟ මුදලට අනුරූපීව අත්හැර දැමීම් | 2024 වසරට අදාලව මු.රෙ. 113 ප්‍රකාරව අත්හැර දැමීම් සඳහා බලය දුන් භාණ්ඩාගාර ලිපි යොමුව සහ දිනය | 2025 වසරට අදාලව වසරට අදාල හිඟ මුදලට අනුරූපීව අත්හැර දැමීම් | 2025 වසරට අදාලව මු.රෙ. 113 ප්‍රකාරව අත්හැර දැමීම් සඳහා බලය දුන් භාණ්ඩාගාර ලිපි යොමුව සහ දිනය | හිඟ මුදලට අදාලව අත්හැර දැමීම්වල මුළු එකතුව (6+8+10) |
| (1) | රු. (2) | රු. (3) | රු. (4) | රු. (5) | රු. (6) | (7) | රු. (8) | (9) | රු. (10) | (11) | රු. (12) |
| | | | | | | | | | | | |

* එක් එක් ආදායම් සංකේතාංක යටතේ වන යම් කිසි ආදායම් අත්හැර දැමීමක් සඳහා මු.රෙ. 113 ප්‍රකාරව භාණ්ඩාගාරයෙන් පූර්ව අනුමැතිය ලබා ගත යුතුවේ. එබැවින් මේ යටතේ සඳහන් කල යුත්තේ එසේ භාණ්ඩාගාරයේ (රාජ්‍ය මුදල් දෙපාර්තමේන්තුවේ) අධිකාර බලය ලබාගත් අත්හැර දැමීම් වන අතර ඒ සඳහා අදාල එක් එක් බලය දීමේ ලිපියේ පිටපතක් ද මේ සමඟ ඇමිණිය යුතුවේ.

**සකස් කලේ :** ....................................................

**පරීක්ෂා කලේ:** ..........................................................................

**ප්‍ර.මු.නි./අධ්‍යක්ෂ (මුදල්)/ප්‍ර.ගණකාධිකාරි/ගණකාධිකාරි**

**ඉහත සඳහන් තොරතුරු නිවැරදි බවට සහතික කරමි**

..........................................................................

**ලේකම් / දෙපාර්තමේන්තු ප්‍රධානියා / දිස්ත්‍රික් ලේකම්**
**(නිල මුද්‍රාව)**

**දිනය:................................**